museum of modern
and contemporary art
sri lanka

## Quarterly Newsletter #10 – January 2025

දෙසැම්බර් 1 අවසන් වූ 'බිම් පෙරළිය' ප්‍රදර්ශනයේ පළමු වටමාරුවේදී නරඹන්නන් 4,853 ක් පිළිගැනීමට ලැබීම පිළිබඳව MMCA ශ්‍රී ලංකා මහත් සතුටට පත්වෙමු. අපේ නරඹන්නන් අතර පාසල් සහ උසස් අධ්‍යාපන ආයතනවල සිසුන් 244ක් ඇතුළත් වූ අතර, 2024 සැප්තැම්බර් 12 මෙම වටමාරුව විවෘත වූ දින සිට අප විසින් අභිරක්ෂණය කළ පොදු වැඩසටහන් 18ට නරඹන්නන් 243ක් සහභාගී විය.

'ඵලදායිව ආරවුල් නිරාකරණයට සහයවීම' ව්‍යාපෘතියේ (SEDR) සහාය ඇතිව MMCA ශ්‍රී ලංකා විසින් අනුග්‍රාහකත්වය සැපයූ සංවාද සහ ප්‍රජා නියැලීම් අධිශිෂ්‍යත්වයේ අධිශිෂ්‍යත්වලාභීන් විසින් පැවැත්වූ වැඩමුළු මාලාව විශේෂ වැදගත්කමකින් යුක්ත විය. කළ්‍යාණි සුන්දරලිංගම්, තමිලිනි සිත්තිරවඩිවේල්, සහ බවනීධා ලෝගනාදන් විසින් මෙහෙයවූ මෙම වැඩමුළු 14 මඟින්, කලාව හරහා ශ්‍රී ලංකාවේ දීර්ඝ කාලීන වාර්ගික ඉඩම් ගැටළුවලට මුල් වූ හේතු සමග නියැලීමට සහභාගීවන්නන්ට ආරාධනා කෙරුණි. මෙම වැඩමුළු MMCA ශ්‍රී ලංකාහි 'බිම් පෙරළිය' ප්‍රදර්ශනය සඳහා විශේෂයෙන් පවරන ලද ජැස්මින් නිලානි ජෝසෆ්ගේ (උ.1990) 'DS Waiting Room' (2024), අනෝමා රාජකරුණාගේ (උ.1965) 'No Other Land', සහ හනුෂා සෝමසුන්දරම්ගේ (උ.1988) '**நகரும் நிலங்கள்**' (2024) සමග සංවාදයක යෙදෙන ලදී.

'බිම් පෙරළිය' ප්‍රදර්ශනයේ දෙවන වටමාරුව දෙසැම්බර් 15 විවෘත කෙරුණි. මෙය සමකාලීන කලාකරුවන් නව දෙනෙකුගේ කලාකෘති හරහා ශ්‍රී ලංකාවේ ඉඩම් පරිවර්තනය වී ඇති පුළුල්, අනපේක්ෂිත, හා කැළඹිලිකාරී ආකාර ගවේෂණය කරයි. මීට අබ්දුල් හාලික් අසීස් (උ.1985), චන්ද්‍රගුප්ත තේනුවර (උ.1960), දනුෂ්ක මාරසිංහ (උ.1985), ඩොමිනික් සැන්සෝනි (උ.1956), ජැස්මින් නිලානි ජෝසෆ් (උ.1990), කෝරලේගෙදර පුෂ්පකුමාර (උ.1968), පාල පොතුපිටිය (උ.1972), ප්‍රදීප් තලවත්ත (උ.1979), සහ ටී. ශනාතනන් (උ.1969) ඇතුළත් වේ.

'බිම් පෙරළිය' දෙවන වටමාරුවට පැමිණෙන නරඹන්නන්ට ප්‍රදීප් තලවත්තගේ පළමු වරට ප්‍රදර්ශනය වන 'You came to see me, and now I'm here' (2023) ඇතුළු අන්තර් ක්‍රියාකාරී කලාකෘති දෙකක් සමඟ සම්බන්ධ වීමට ආරාධනා කෙරේ. 2014දී ශාජා බියනාලේ ප්‍රදර්ශනයේදී ප්‍රථම වරට ප්‍රදර්ශනය කළ ටී. ශානාතනන්ගේ 'Drawers of War Transactions' (2019) ශ්‍රී ලංකාවේ පළමු වරට ප්‍රදර්ශනය වන අනෙත් අන්තර් ක්‍රියාකාරී කලාකෘතිය යි. මෙම කලාකෘති දැකගැනීමට, වටමාරුව මාර්තු 2 අවසන්වීමට පෙර ක්‍රෙස්කැට් බූලෙවාඩ්හි බිම් මහළේ පිහිටි කෞතුගාරයට පැමිණෙන්න!

අපගේ වාර්ෂික නත්තල් කැරොල් වැඩසටහන සඳහා ගීතිකා මාස්ටර් හරීන් අම්ර්තනාදන්ගේ අධ්‍යක්ෂණයෙන් ශාන්ත තෝමස් කනිෂ්ඨ පාසලේ ගායක වෘන්දය පිළිගැනීමට ලැබීම අපට මහත් සතුටකි.

Registered Address:
117 Sir Chittampalam A. Gardiner Mawatha
Colombo 02
Sri Lanka

info@mmca-srilanka.org
www.mmca-srilanka.org